මගේ අංකය :- JSC/SEC/CIR/2021

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,**

**<u>අධිකරණවල සුළු අළුත්වැඩියා හා කුඩා පරිමාණයේ ඉදිකිරීම් කටයුතු</u>**

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත යොමු කර ඇති අංක MOJ/SEC/02/03 හා 2021.05.05 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපියෙහි 04 වන ඡේදය ප්‍රකාරව අවශ්‍ය කටයුතු සඳහා එය ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. අදාල ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 මැයි මස 12 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

**පිටපත : ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, කොළඹ 12 - දැ.ගැ.ස.**

ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone } 2448959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. } 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone } 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. } 2320785
Web Site: www.moj.gov.lk


අධිකරණ අමාත්‍යාංශය

நீதி அமைச்சு

MINISTRY OF JUSTICE

ANNEXE A


ත.පෙ. / தபால்பெட்டி / P.O. Box } 555
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } info@moj.gov.lk
උත්තරීතර අධිකරණ සංකීර්ණය, කොළඹ 12
உயர் நீதிமன்றக் கட்டடத்தொகுதி, கொழும்பு 12
Superior Courts Complex, Colombo 12.


06 MAY 2021

මගේ අංකය / எனது இல. / My No. } MOJ/SEC/02/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021.05.05

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

**අධිකරණවල සුළු අළුත්වැඩියා හා කුඩා පරිමාණයේ ඉදිකිරීම් කටයුතු**

අධිකරණ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිළධාරීන් දිවයින පුරා උසාවිවල යටිතල පහසුකම් පිළිබඳ පරීක්ෂා කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අනුයුක්ත කරන ලදී. එයින් 50% පමණ ප්‍රමාණයක් නිම කරන ලද අතර covid-19 තත්වය ව්‍යාප්ත වීම මත ඉතිරි කාර්යයන් කල් දමන ලදී.

02.කෙසේ වුවද, ලැබී ඇති වාර්තා අනුව සංචාරක උසාවි, මහේස්ත්‍රාත් උසාවි හා දිස්ත්‍රික් උසාවි ආදියෙහි සුළු අළුත්වැඩියාවන් රාශියක් ඇති බැව් නිරීක්ෂණය වී ඇත. ඇතැම් අධිකරණවල වැසිකිළි පහසුකම් වැනි අත්‍යාවශ්‍ය පහසුකම් නොමැති අතර මේවා කඩිනමින් සම්පූර්ණ කළ යුතුව ඇත.

03.එබැවින් දැනට අමාත්‍යාංශයේ පවත්නා ඉංජිනේරු හා තාක්ෂණික කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් මෙම කාර්යන් අමාත්‍යාංශයේ මාණ්ඩලික නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් සිදුකර ගැනීමට ප්‍රතිපත්තිමය තීරණයක් අධිකරණ අමාත්‍යාංශය විසින් ගනු ලැබිය.ව්‍යාපෘතීන් අධීක්ෂණය අධිකරණ අමාත්‍යාංශ විසින් සිදු කරනු ලබන අතර අවසන් ගෙවීම් සහතික කරනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය විසිනි.

04.එයට අදාලව දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කළ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.කරුණාකර මේ සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණ සහාය ලබාදෙන ලෙස විනිසුරුවරු මඟින් රෙජිස්ට්‍රාර්වරුන් වෙත දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

පිටපත්: 01.අතිරේක ලේකම් (ඉංජිනේරු)
02. අතිරේක ලේකම් (සංවර්ධන)
03.ප්‍රධාන ගණකාධිකාරී
04.අධ්‍යක්ෂ (ප්‍රතිසංස්කරණ)
} දැ.ගැ.පි.

Telephone 2449959

ෆැක්ස් අංකය
Fax No. 2445447

secretary@moj.gov.lk

දුරකථනය
Telephone 2323022

ෆැක්ස් අංකය
Fax No. 2320785

Web Site: www.moj.gov.lk


අධිකරණ අමාත්‍යාංශය

நீதி அமைச்சு

MINISTRY OF JUSTICE


Tele

P.O. Box 555

E-mail info@moj.gov.lk

උසස් අධිකරණ සංකීර්ණය
කොළඹ 12
Superior Courts Complex,
Colombo 12.


මගේ අංකය
My No. MOJ/SEC/02/COMMO

ඔබේ අංකය
Your No.

දිනය
Date 2021.05. 04

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්

**<u>අධිකරණවල සුළු අළුත්වැඩියා හා කුඩා පරිමාණයේ ඉදිකිරීම් කටයුතු</u>**

ඔබ දිස්ත්‍රික්කයේ ඇති අධිකරණවල සුළු අළුත්වැඩියා, සවි කිරීම,කුඩා පරිමානයේ ඉදි කිරීම කටයුතු සිදුකර ගැනීම සඳහා එකී උසාවිය පිහිටි බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ හා තාක්ෂණ නිළධාරීන්ගේ සහාය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

02.අදාල කාර්යය ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනුම් දුන් පසුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිළධාරීන්ට එකී අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විමසා අදාල ඇස්තමේන්තු සකස් කොට ප්‍රාදේශීය ලේකම්වරයා මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදුකොට අදාල කාර්යය ඉටුකරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබාදීම මැනවි.

03.තවද අදාල අළුත්වැඩියා අවශ්‍යතාවයන් පිළිබඳව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අදාල අධිකරණයට පිටපත් සහිතව අධිකරණ අමාත්‍යාංශය දැනුම් දෙන අතර ඒ අනුව අදාල ප්‍රසම්පාදන කාර්යන් ආරම්භ කළ යුතුය.

04.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇස්තමේන්තු ලැබීමෙන් අනතුරුව ඊට අදාල ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

05.තවද, අමාත්‍යාංශයේ නිළධාරීන් විසින් ව්‍යාපෘතිය අධීක්ෂණය කරනු ලබන අතර අදාල ගෙවීම නිර්දේශ කරනු ලබන්නේ අමාත්‍යාංශයේ ඉංජිනේරුවරයෙකු මඟිනි.

කරුණාකර මේ පිළිබඳව ඔබ දිස්ත්‍රික්කයේ අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය